# ප්‍රස්ථාපිරුළු-3

21) ඉස්සර ආ කනට වඩා පස්සේ ආ අඟ ලොකුයි

පළමුව හිතවත්ව සිටි අය ඉවත් කර පසුව හිතවත් වූ අය ඇසුරු කිරීම

22) ලැජ්ජා නැතිකම මහමුදළිකමට වඩා ලොකුයි

තමාගේ තත්ත්වයට නොගැළපෙන වැඩ කිරීම

23) වඳින්න ගිය දේවාලේ ඉහේ කඩා වැටුනා වගෙයි

යහපත් වැඩක් කිරීමට ගොස් කරදරයක වැටීම

24) හිසේ ඇම්මට කොට්ටය මාරු කළා වගෙයි

ගැටළුවකට සුදුසු විසඳුමක් නොදී වෙන දේවල් කිරීම

25) ගඟට ඉනි කැපුවා වගෙයි

වෙහෙස වී කළ වැඩෙන් ප්‍රතිඵලයක් නොමැති වීම

26) වංසෙ කබල් ගෑම

කිසි හැකියාවක් නැති අයෙකු පරම්පරාව ගැන ආඩම්බර වීම

27) ඉබ්බා දියට දැම්මා වගෙයි

තමාට උවමනා ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලැබීම

28) කැකිල්ලෙ රජ්ජුරුවන්ගෙ නඩු තීන්දුව වගෙයි

වැරදි විනිශ්චය නිසා අහිංසකයින් දඬුවම් ලැබීම

29) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගෙයි

කරදරයක් වී සිටින විට තවත් කරදරයක් වීම

30) හතර බීරි කතාව වගෙයි

යම් දෙයක් ගැන සම්බන්ධ අය විවිධ අදහස් ප්‍රකාශ කිරීම